**නෙළුව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නෙළුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

  පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණු කර්මාන්ත සඳහා රු.2,000,000 ක ප්‍රාග්ධන ආධාර ණයගැති සහ ප්‍රාග්ධන වියදම් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ශේෂ වල වටිනාකම වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදි නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයන්හි දී සභාවට ලැබී තිබුණු රු.5,425,850 ක එක්වන් මුදල් ආදායමට ගැලපීම් නොකර, ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු කර්මාන්තයක් සඳහා රු.575,000 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැරණි විදුලි උපකරණ ඉතිරි තොගය රු.161,435 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.535,837 ක ස්ථාවර වත්කම් ආදායම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.540,271 ක් වටිනා ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | එකඟ වන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක් වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 හා 24 වගන්තිය | සභා මාර්ග පිළිබඳ විස්තර ඇතුළත් මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදි සකස් කිරීමට කටයුතු කරන බව . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.146,250 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 ඔක්තෝබර් 05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) වගන්තිය | 2022 වර්ෂයේ දී සභිකයින් 15 දෙනෙකු සභා රැස්වීම් සඳහා නොපැමිණ වෛද්‍ය වාර්තා ද ඉදිරිපත් කර නොතිබූ නමුත්, සභාව විසින් රු.690,000 ක දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේදී වෛද්‍ය වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,178,452 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.231,625 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉතිරිකිරීම් ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට රු.3,304,366 ක ශේෂයක් පැවති අතර, එම අතිරික්ත මුදල් සුරක්ෂිතව ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබුණි. | රු.1,000,000 සුරකුම්පත් විවෘත කර ඇති බව. | අතිරික්ත මුදල් ආයෝජනය කළ යුතු වේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු | 425,000 | 438,883 | 390,772 | 106,204 | 428,000 | 323,167 | 315,910 | 58,093 |
| කුලී | 7,587,694 | 6,561,510 | 4,366,788 | 4,093,845 | 7,879,600 | 2,664,473 | 2,669,473 | 1,899,123 |
| බලපත්‍ර ගාස්තු | 283,600 | 172,430 | 212,725 | - | 285,500 | 165,325 | 553,792 | 40,295 |
| වෙනත් ආදායම් | 3,093,724 | 2,988,203 | 2,986,928 | 222,285 | 3,107,330 | 4,681,741 | 4,612,638 | 221,010 |
| | 11,390,018 | 10,161,026 | 7,957,213 | 4,422,334 | 11,700,430 | 7,834,706 | 8,151,813 | 2,218,521 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.2,218,521 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.4,422,334 ක් විය. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ කුලී ආදායම රු.1,899,123 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ දී එය රු.4,093,845 ක් විය. | ඉදිරියේදි අය කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර සඳහා වූ සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, කඩ කාමර 17 කට අදාළ බදු ගිවිසුම් 2017 හා 2019 වර්ෂ වලින් පසු යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල කටයුතු ඉදිරියේදි සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධීක්ෂණය යටතේ විදුලිබල අමාත්‍යාංශය මඟින් රු.1,680,000 ක පිරිවැයක් සහිතව ක්‍රියාත්මක කරන ලද සූර්ය බලශක්තියෙන් විදුලි උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් සභාවට ලැබෙන ආදායමෙහි නිවැරදිතාවය පිළිබඳ කිසිදු පසු විපරමක් සභාව විසින් සිදු කර නොතිබුණි. | ලැබෙන ආදායම නිසි පරිදි ගිණුම්ගත කරන බව. | ගිවිසුම් ගත විය යුතු අතර පසු විපරම් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කබරගල වත්ත ඉඩමේ ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා සභාව විසින් රු.1,164,613 ක වියදමක් දරා තිබුණ ද, මෙම ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව. | ඉඩම සභාවට පවරා ගත යුතු වේ. |

### 3.3 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීමට රු.3,000,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණ ද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර, අත්හැර දමා තිබුණි. | 2022 වර්ෂයේ මිල ගණන් සීග්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් අනුමත ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවන බව. | අනුමත ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉහල මද්දේගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ පස් ප්‍රවාහනය කිරීම සඳහා රු.54,240 ක් ද, මෝටර් ග්‍රේඩරය යොදා පස් ඇතිරීම සඳහා රු.49,978 ක් සහ ප්‍රවාහනය කර තිබුණු පස් ගොනුගත කර නොතිබිය දී ඒ සඳහා රු.136,292 ක් | පස් ප්‍රමාණය 1Km පමණ දුරින් ප්‍රවාහනය කළද එය ප්‍රමාණාත්මක නොවන බවත්, පස් මිණුම් ගත කිරීමට වාහන මිණුම් යොදාගත් බවත්, වැඩිපුර ගෙවීම් රඳවුම් මුදලින් අඩුකර ගන්නා බව. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වශයෙන් රු.236,510 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | | |
| (ආ) | නෙළුව මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම - භූමිය සකස් කිරීම කර්මාන්තය ඉටු කිරීම සඳහා වැඩ විෂය 1 යටතේ සභාවට අයත් බටුවන්ගල ආදාහනාගාර භූමියෙන් පස් ලබාගෙන තිබියදීත් ඒ සඳහා රු.429,592 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | මාසික මහා සභා තීරණය අනුව බටුවන්ගල ආදාහනාගාර භූමියෙන් ලබාගෙන ඇති පස් ප්‍රමාණය කොන්ත්‍රාත්කරු ප්‍රවාහනය කර ඇති බව. | - එම - |
| (ඇ) | නෙළුව මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම - 2021 කාණු පද්ධතිය සකස් කිරීම(ඉතිරි ප්‍රතිපාදන) කර්මාන්තයේ වැඩ විෂය 1.5 යටතේ හැඩයම් වැඩ සඳහා නියමිත මිල අනුපාත යොදා නොගැනීම නිසා රු.256,705 ක් සහ කොන්ක්‍රීට් වැඩ සඳහා රු.23,493 ක් වශයෙන් රු.280,198 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ST – 063 මිල අනුපාතය සහ Ct – 08 මිල අනුපාත යොදාගත් බව. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |
| (ඇ) | නෙළුව මහජන ක්‍රීඩාංගනය කාණු පද්ධතිය සැකසීම II අදියර කර්මාන්තයේ වැඩ විෂය 1.5 යටතේ හැඩයම් වැඩ සඳහා නියමිත මිල අනුපාත යොදා නොගැනීම නිසා රු.107,257 ක් සහ කොන්ක්‍රීට් වැඩ සඳහා රු.11,318 ක් වශයෙන් රු.118,575 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ST – 063 මිල අනුපාතය සහ Ct – 08 මිල අනුපාතය භාවිතා කළ බව. | - එම - |